ප්‍රධාන ලේකම් කාර්යාලය
සබරගමුව පළාත් සභාව
பிரதான செயலாளர் அலுவலகம்
சபரகமுவ மாகாண சபை
**Office of the Chief Secretary**
**Sabaragamuwa Provincial Council**

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 045 - 2231703, 077 - 3122407
කාර්යාලය / அலுவலகம் / Office: 045 - 2222143, 045 - 2222144, 045 - 2223080
ෆැක්ස් / தொலைநகல் / Fax: 045 - 2222793
විද්‍යුත් තැපෑල / மின்அஞ்சல் / E-mail: chiefsecretary@sg.gov.lk, herath_p_kularathna@yahoo.com

පළාත් සභා කාර්යාල සංකීර්ණය, නව නගරය, රත්නපුර. மாகாண சபைக் கட்டிடத் தொகுதி, புதிய நகரம்-இரத்தினபுரி Provincial Council Complex, New Town, Ratnapura.


මගේ අංකය / எனது இல. / My Ref. DCS/PT/DO/02/Allow
ඔබේ අංකය / உமது இல. / Your Ref. ..................
දිනය / திகதி / Date 2015.02.25

## ප්‍රධාන ලේකම් චක්‍රලේඛ අංක - 02/2015

සබරගමුව පළාත් සභාවේ,

සියළුම ලේකම්වරු, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,ආයතන ප්‍රධානීන්.

### <u>පෞද්ගලික පාඨමාලා සඳහා ගාස්තු/අධ්‍යයන නිවාඩු ලබාදීම</u>

සබරගමුව පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකයෙන් පෞද්ගලික පාඨමාලා සඳහා ගාස්තු ලබාදීමට අදාල 2009.09.01 දිනැති අංක 02/2009 ප්‍රධාන ලේකම් චක්‍රලේඛය හා 2009.11.10 දිනැති අංක සීඑස් 11603 දරණ චක්‍රලේඛය 2015 මාර්තු 01 දින සිට බලරහිත කරන අතර එදින සිට සබරගමුව පළාත් සභාවේ සියළුම ආයතන සඳහා මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාල වේ.

2. පෞද්ගලික පාඨමාලා සඳහා ගාස්තු ලබාගැනීම සඳහාවන ඉල්ලීම් සහ අධ්‍යයන නිවාඩු ලබාගැනීම්වලට අදාල ඉල්ලීම් එම නිලධාරියා අයත් අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කල යුතු අතර පහත සඳහන් කොන්දේසි වලට යටත්ව අමාත්‍යාංශ ලේකම් විසින් එම අමාත්‍යාංශයේ ධාරිතා සංවර්ධන වැය විෂයට අදාල ප්‍රතිපාදන වලින් එම පාඨමාලා ගාස්තු ලබාදීම සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට යටත්ව අදාල වන පරිදි අධ්‍යයන නිවාඩු ලබාදීම සිදුකල යුතුය. පාඨමාලා ගාස්තු ලබාදිය යුත්තේ පහත සඳහන් පාඨමාලා සඳහා පමණි.

   අ.) අදාල පාඨමාලාව නිලධාරියාගේ සේවා ව්‍යවස්ථාව/බඳවාගැනීමේ පටිපාටිය අනුව සම්පූර්ණ කලයුතු යුතු සුදුසුකම්(මෙය බඳවා ගැනීමේ සුදුසුකම නොවේ) සම්පූර්ණ කිරීමේ පාඨමාලා සඳහා හෝ

   ආ.) ආයතන ප්‍රධානියාගේ නිර්දේශය මත හදාරනු ලබන,රාජකාරී කටයුතු සඳහා සෘජුවම අදාල වන කෙටිකාලීන පාඨමාලා සඳහා

3. ඉහත 2. අ) වගන්තියේ සඳහන් පාඨමාලා සඳහා සම්පූර්ණ පාඨමාලා ගාස්තුව ලබාදිය යුතු අතර අනෙකුත් සියළුම පාඨමාලා සඳහා පාඨමාලාවේ ප්‍රමඛතාවය හා අදාලත්වය මත, ගෙවනු ලබන පාඨමාලා ගාස්තු ප්‍රමාණය අමාත්‍යාංශ ලේකම් විසින් තීරණය කළ යුතුය.


| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් பிரதிப் பிரதான செயலாளர் Deputy Chief Secretary | පාලන நிர்வாகம் Administration | පිරිස් හා පුහුණු ஆளணி மற்றும் பயிற்சி Personnel & Training | මූල්‍ය කළමනාකරණ நிதி முகாமைத்துவம் Financial Management | ක්‍රම සම්පාදන திட்டமிடல் Planning | ඉංජිනේරු සේවා பொறியியல் சேவை Engineering Services |
|---|---|---|---|---|---|
| දුරකථන தொ.பே.இல Telephone | 045-2228414 | 045-2224562 | 045-2231224 | 045-2222173 | 045-2222349 |
| ෆැක්ස් தொலைநகல் Fax | 045-2222793 | 045-2222793 | 045-2223052 | 045-2222173 | 045-2222349 |
| විද්‍යුත් තැපැල மின் அஞ்சல் E-mail | spcdcsad@gmail.com | dcspt@cadreinfo.sg.gov.lk spcdcsoffice@gmail.com info@sgmdtu.lk | spccigas@yahoo.com spcaccpay@gmail.com | spcplan@yahoo.com | esbnewtown@gmail.com |

4. පාඨමාලා ගාස්තු යන්නට, පාඨමාලා ගාස්තුව පමණක් අදාල වන අතර ලියාපදිංචි ගාස්තු, විභාග ගාස්තු, පුස්තකාල ගාස්තු ආදී වෙනත් කිසිදු ගාස්තුවක් ඇතුළත් නොවේ.

5. සේවා ව්‍යවස්ථාව/බඳවාගැනීමේ පටිපාටිය අනුව සම්පූර්ණ කළයුතු අවම අවශ්‍යතාවය සම්පූර්ණ කර ඇති නිලධාරීන් සඳහා ඉහත 2. අ.) වගන්තියට අදාල පාඨමාලා ගාස්තු ලබා නොදිය යුතුය.
තවද පාඨමාලා ගාස්තු ගෙවිය යුත්තේ සේවා ව්‍යවස්ථාව/බඳවාගැනීමේ පටිපාටිය අනුව සම්පූර්ණ කළ යුතු අවම අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා පමණි.

උදාහරණ - යම් නිලධාරියෙකුගේ සේවා ව්‍යවස්ථාව අනුව උසස්වීම් සඳහා ඩිප්ලෝමා පාඨමාලාවක් අවශ්‍යය යැයි සඳහන් විට පාඨමාලා ගාස්තු ගෙවිය යුත්තේ එම ඩිප්ලෝමා පාඨමාලා සඳහා පමණි.යම් නිලධාරියෙකු ඩිප්ලෝමා පාඨමාලාව වෙනුවට පශ්චාත් උපාධි පාඨමාලවක් හැදෑරීමට අපේක්ෂා කරයි නම්,ගෙවිය යුත්තේ ඉහත සඳහන් කළ ඩිප්ලෝමා පාඨමාලාවට අදාල පාඨමාලා ගාස්තුව පමණි.

6. සෑම පාඨමාලාවක්ම හැදෑරීමට පෙර අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු අතර පූර්ව අනුමැතිය ලබා නොගෙන හදාරනු ලබන හෝ සම්පූර්ණ කරන ලද කිසිදු පාඨමාලාවක් සඳහා පාඨමාලා ගාස්තු ලබා නොදිය යුතුය.

7. පාඨමාලා ගාස්තු ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මූල්‍ය කළමනාකරණ) සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) සමඟ සාකච්ඡාකර ධාරිතා සංවර්ධන වැය විෂය යටතේ ඒ ඒ වර්ෂවලට අදාල ඇස්තමේන්තු වලට ඇතුළත් කර ගත යුතුය.

8. පාඨමාලාව හදාරනු ලබන ආයතනය රජයේ හෝ රජයට අනුබද්ධ ආයතනයක් විය යුතුය.

9. පාඨමාලා ගාස්තු හා අධ්‍යයන නිවාඩු ලබාදීමේදී ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි වල විධිවිධාන පිළිපැදිය යුතු අතර, නියමිත කාලයේදී පාඨමාලාව සම්පූර්ණ නොකරන නිලධාරීන්ගේ වැටුපෙන්, ගෙවන ලද පාඨමාලා ගාස්තු අයකර ගැනීමටත්, ලබාගෙන ඇති අධ්‍යයන නිවාඩු එම නිලධාරියාට හිමි පෞද්ගලික නිවාඩු වලින් අඩුකිරීමටත් අමාත්‍යාංශ ලේකම් විසින් කටයුතු කළ යුතුය.

10. එක් නිලධාරියෙකු හෝ නිලධාරීන් කිහිපදෙනෙකු විසින් දිගින් දිගටම පෞද්ගලික පාඨමාලා සඳහා ගාස්තු ලබාගැනීම වැළැක්වීමට අදාල අභ්‍යන්තර පාලන ක්‍රමයන් අනුගමනය කිරිමට අමාත්‍යාංශ ලේකම්වරු වගබලා ගත යුතුය.

11. ප්‍රධාන ලේකම් යටතට සෘජුවම අයත් ආයතන වල (නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාල,අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව,පළාත් ආදායම් දෙපාර්තමේන්තුව )නිලධාරීන්ගේ පෞද්ගලික පාඨමාලා ගාස්තු සඳහාවන ඉල්ලීම්,පාඨමාලා හැදෑරීමට පෙර ආදල ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව ප්‍රධාන ලේකම් වෙත යොමු කල යුතුවේ.එම නිලධාරීන් සඳහා ද මෙම චක්‍රලේඛයේ අනෙකුත් කොන්දේසි එලෙසින්ම අදාල වේ.

12. මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාල වනුයේ දේශීය පුහුණු පාඨමාලා සඳහා පමණි.

13. මෙම චක්‍රලේඛයේ අවශ්‍ය තැන්හිදී අවස්ථානුකූලව,අමාත්‍යාංශ ලේකම් යන්නට,ආණ්ඩුකාරවර ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,සභා ලේකම් යන්න ආදේශ කරගත යුතුය. (එම ආයතන වල නිලධාරීන් සඳහා පෞද්ගලික පාඨමාලා සඳහා ගාස්තු ලබාදීමේදී)

14. 2015 මාර්තු 01 දිනට පෙර ප්‍රධාන ලේකම් විසින් අනුමත කරන ලද පාඨමාලා ගාස්තු සඳහා 2009.09.01 දිනැති 02/2009 ප්‍රධාන ලේකම් චක්‍රලේඛයේ විධිවිධාන එලෙසින්ම අදාල වේ.

15. පෞද්ගලික පාඨමාලාවලට ගාස්තු ගෙවීම හා අධ්‍යයන නිවාඩු වලට අදාලව මෙම චක්‍රලේඛයෙන් ආවරණය නොවන සෑම කරුණක් සම්බන්ධයෙන්ම සුදුසු පරිදි, ප්‍රධාන ලේකම්ගේ උපදෙස් හා අනුමැතිය ලබාගත යුතුවේ.

හේරත් පී. කුලරත්න,
ප්‍රධාන ලේකම්,
සබරගමුව පළාත් සභාව.

**ප්‍රධාන ලේකම් කාර්යාලය**
**සබරගමුව පළාත් සභාව**
பிரதான செயலாளர் அலுவலகம்
சபரகமுவ மாகாண சபை
**Office of the Chief Secretary**
**Sabaragamuwa Provincial Council**

| | | |
|---|---|---|
| ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary | } | 045 - 2231703<br>070 - 2781720<br>077 - 3265695 |
| කාර්යාලය / அலுவலகம் / Office | } | 045 - 2222143<br>045 - 2222144<br>045 - 2223080<br>045 - 2232263 |
| ෆැක්ස් / தொலைநகல் / Fax | } | 045 - 2222793 |
| විද්‍යුත් තැපැල / மின்அஞ்சல் / E-mail | } | chiefsecretary@sg.gov.lk<br>malaninedungamuwa@gmail.com |

පළාත් සභා කාර්යාල සංකීර්ණය, නව නගරය, රත්නපුර. மாகாண சபைக் சட்டிடத் தொகுதி. புதிய நகரம்-இரத்தினபுரி Provincial Council Complex, New Town, Ratnapura.


මගේ අංකය / எனது இல. / My Ref. } DCSPT/04/T1/08/02 ...... ඔබේ අංකය / உமது இல. / Your Ref. } ...... දිනය / திகதி / Date } 2020/01/08 .

සබරගමුව පළාත් සභාවේ,

සියළුම ලේකම්වරු, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් වෙත.

<u>පෞද්ගලික පාඨමාලා සඳහා ගාස්තු/ අධ්‍යයන නිවාඩු ලබාදීම</u>

සබරගමුව පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකයෙන් පෞද්ගලික පාඨමාලා සඳහා ගාස්තු ලබාදීමට අදාළව 2015.02.25 දිනැති ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛ අංක 02/2015 ට වැඩිමනත් වශයෙනි.

02. එම චක්‍රලේඛයේ විධි විධාන ප්‍රකාරව ලබාදෙනු ලබන පෞද්ගලික පාඨමාලා සඳහා වන ගාස්තු හැරුනු විට නිලධාරියාට පාඨමාලාව හැදෑරීම වෙනුවෙන් වෙනත් කිසිඳු දීමනාවක් (ගමන් වියදම්, සංයුක්ත දීමනා, ඉන්ධන දීමනා, නිවාඩු දින වැටුප්) ගෙවනු නොලැබේ.

ඩී. එම්. මාලනී,
ප්‍රධාන ලේකම්,
සබරගමුව පළාත් සභාව.